සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**තොරතුරු පත්‍රිකාව**

## රූපණයේ යෙදෙමු

රූපණය යනු රඟ දැක්වීම ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය. රූපණය යනු ඉබේ ඇති වන දෙයක් නොවේ. එය කලාවක් සේම දීර්ඝ කාලීන ව ප්‍රගුණ කළ යුතු විෂයක් ද වේ. රූපණය උපයෝගී කොට ගෙන නළුවෙකු හෝ නිළියක ප්‍රමුඛ ලෙස සතර අභිනය, භාවිතයට ගනිමින් ප්‍රේක්ෂකයා ඉදිරියේ කතාවක් රඟ දක්වා පෙන්වීම සිදු කරනු ලබයි. රූපණය වේදිකා නාට්‍යයේ දී පමණක් භාවිත වන්නක් නොව එය සිනමාව, රූපවාහිනිය ආදී කලා මාධ්‍ය තුළ ද භාවිත කෙරේ.

සාර්ථක රූපණ වේදිකා ශිල්පියෙකු සතුව,

- වෙහෙසීමට හැකි වීම
- දැඩි අත්ම විශ්වාසයක් තිබීම
- අසීරුතා නොසලකා හැරීම
- ඕනෑම කායික හෝ මානසික තත්ත්වයකට එහි පතුලට ම කිඳා බැසීමට හැකි හැකියාව ආදී ගුණාංග තිබිය යුතු ය.

**පැවරුම**

1. රූපණය යනු කුමක්ද
2. රූපණ ශිල්පියකු සතුව තිබිය යුතු ගුණාංග මොනවාද.
3. ඔබ කැමති චරිතයක් නිරූපණය කර ඔබගේ විෂය භාර ගුරුභවතාට පෙන්වන්න.